**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2016**

**-----------------------------------------------------------------**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(අ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.221,145 ක විගණන ගාස්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් පසු මෙහෙයුම් නොවන වියදම් ලෙස හෙළිදරව් කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 27 (ආ) ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී දේපල පිරියත හා උපකරණ මත ක්ෂයවීම් රු. 57,053 ක් හා රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය රු.57,053 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.10,526,172 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | පර්යේෂණ ව්‍යාපෘති 05 ක ගෙවීම් | 9,857,087 | මූල්‍ය සහ කාර්යසාධන ප්‍රගති වාර්තා |
| (ආ) | පර්යේෂණ දීමනා | 669,085 | අනුමැතිය හා ප්‍රගති වාර්තා |
| | | 10,526,172 | |

### 2.3 ගෙවිය යුතු ගිණුම්

මිලදී ගැනීම් සම්බන්ධයෙන් අතරදවා ගෙන ඇති මුදල්, එකී මිලදී ගත් අයිතමයේ අඩුපාඩු පවතී නම් ඒවා නිවැරදි කිරීමට යොදා ගැනීම හෝ අදාළ ආයතනය වෙත ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. එසේ නැතහොත් මුදල් රෙගුලාසි 571(ඇ) ප්‍රකාරව ආයතනයේ අරමුදලට බැර කළ යුතුය. නමුත් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයට අදාළ රු.839,707 ක් වටිනා රැඳවුම් මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර එම මුදල් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 103 | පර්යේෂණ ව්‍යාපෘති තුනක් මගින් 1993 සිට 1996 දක්වා වර්ෂවලදී මිලදීගෙන තිබුණු රු.4,353,301 ක් වටිනා ස්ථාවර වත්කම් භෞතිකව ආයතනය තුළ නොමැති බැවින් ඒවා පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇතත්, එසේ අස්ථාන ගතවූ වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි |
| (ආ) | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන සඳහා වූ ආයතන සංග්‍රහය** | |
| | II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) වගන්ති | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයා ගන්නා ගාස්තු ප්‍රමාණයකින් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.18,856,295 ක බාහිර දේශන ගාස්තුවලින් රු.1,885,629 ක ගාස්තුව ගෙවන අවස්ථාවේ දී අවකරණය කරගෙන අදාළ ආයතන අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යයන්ගේ පර්යේෂණ කටයුතු වෙනුවෙන් රු.710,300 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් පර්යේෂණ සඳහා පහසුකම් අරමුදල මගින් කෘෂිකර්ම පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී වෙත ලබා දී තිබුණද, එකී අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,996,509 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,129,963 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,133,454 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අනෙකුත් ඉපයීම් රු. 8,536,209 කින් වැඩිවුවද, පෞද්ගලික පඩිනඩි හා වේතන රු. 5,778,728 කින් වැඩිවීම හා බොල් ණය වියදම රු.4,329,266 ක් වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 67,882,740 ක් වූ ආයතනයේ දායකය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.112,221,681 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1979 අංක 09 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අනුව ආයතනයේ අරමුණු කෙටියෙන් පහත දැක්වේ.

- පශ්චාත් උපාධි පාඨමාලාවන්හී ඉහළ අධ්‍යයන ප්‍රමිතීන් සපුරා ගැනීම හා පවත්වාගෙන යාම.
- පශ්චාත් උපාධිධාරීන් අතර උසස් වෘත්තීය හා නායකත්ව ගුණාංග ඇති කිරීම, ඉහළ ආචාර ධර්ම හා සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීම හා සීඝ්‍රයෙන් වෙනස්වන ගෝලීය සංවර්ධනයට අනුවර්තනය විය හැකි පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම.
- ඉහළ ප්‍රමිතීන්හි මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ශිෂ්‍යයන් අතර නවෝත්පාදන පර්යේෂණ සඳහා ශක්‍යතාවය ගොඩනැගීම.
- අධ්‍යයන වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම සඳහා දක්ෂ හා කැපවුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සහ කාර්යක්ෂමව පරිපාලන, තාක්ෂණික හා සහායක කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීම, දැනුම ව්‍යාප්ති කිරීම හා පුස්තකාල වැඩිදියුණු කිරීම.
- ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම හා ආසියානු කලාපයේ හා ඉන් ඔබ්බට පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස විශිෂ්ටත්වය ළඟා කර ගැනීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර සහ දේශීය ශ්‍රේණිගත කිරීම්වලදී විදේශ ශිෂ්‍යයන් ලියාපදිංචි වීමේ සංඛ්‍යාව ප්‍රධාන නිර්ණායකයක් වශයෙන් සලකනු ලැබුවත්, පසුගිය වසර 04 තුළ විදේශ ශිෂ්‍යයන් තිදෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි. කෙසේ වුවද කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට 2015 වර්ෂයේ දී ලෝක ශ්‍රේණිගත (World Ranking) කිරීමේදී 15,632 වන ස්ථානය හා දේශීය වශයෙන් 27 වන ස්ථානය හිමි වී තිබු අතර, 2016 වර්ෂයේ දී පිළිවෙලින් 16,389 වන ස්ථානය හා 24 වන ස්ථානය හිමි වී තිබුණි.

(ආ) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (MBA) සඳහා 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සිසුන් 179 ක් ලියාපදිංචි වී ඇතත්, ඉන් පාඨමාලාව සාර්ථකව නිමකර තිබුණේ සිසුන් 07 ක් හෙවත් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 4 ක් පමණි. M. Phill by course work and research පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලියාපදිංචි වූ සිසුන් අතරින් කිසිවෙකු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ එහි ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.85,279,284 ක සිට රු.343,204,566 ක් දක්වා අඛණ්ඩව වර්ධනය කර ගනිමින් පැවතුණි. නමුත් ආයතනය එම අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කරගැනීම සඳහා අවධානය යොමු නොකිරීම මෙලෙස අරමුදල් ශේෂය අඛණ්ඩව වර්ධනය වීමට හේතු වී තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් මිලදී ගත් රු.1,499,081 ක් වටිනා ස්ථාවර වත්කම් හා රු.348,560 ක් වටිනා රසායනික ද්‍රව්‍ය ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් නොකර කෘෂිකර්ම පීඨය වෙත සෘජුවම නිකුත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන මඟින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පරිබාහිර නිලධාරීන් 07 දෙනෙකු වෙත රු.273,240 ක් ලබා දී මිල දී ගෙන තිබූ පරිභෝජන ද්‍රව්‍ය ආයතනය වෙත ලැබී නොමැති අතර, ලේඛනවල ද ඇතුළත් කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ආයතනය විසින් පවත්වනු නොලබන පාඨමාලාවකට අදාලව වෙනත් බාහිර ආයතනයක කථිකාචාර්යවරියක් වෙත ඉන්දියාවේ පැවති පාඨමාලාවක් සඳහා සහභාගී වීම වෙනුවෙන් රු.462,122 ක ගුවන් ටිකට්පත් හා වීසා ගාස්තු ආයතනයේ අරමුදලින් වැයකර තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ කටයුතු සඳහා 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ බාහිර ආයතන විසින් ආයතනය වෙත ලබා දෙන ලද රු.11,016,355 ක මුදලක් එකී පර්යේෂණ කටයුතු සඳහා යොදා නොගෙන ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.

(ආ) වර්ෂය අවසානයේ ඉතිරි කිරීමේ බැංකු ගිණුම් 03 ක එකතුව රු.690,482 ක ශේෂයක් වසර 05 කට අධික කාලයක සිට අක්‍රීයව පැවතිණි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම, වැඩිදියුණු කර ගැනීම, පුනරුත්ථාපනය සඳහා ලබා දී තිබුණු රු.10,000,000 ක මුදලින් එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර තිබුණේ රු.3,467,000 ක මුදලක් හෙවත් සියයට 34.67 කි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (MBA) පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍යයන් වෙත අලෙවි කිරීම සඳහා ආයතනය විසින් 2013, 2014 සහ 2015 වර්ෂවලදී විධිමත් ඇස්තමේන්තුවකින් තොරව මිලදී ගත් පොත් අතුරින් 2017 ජනවාරි 30 දිනට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණු පොත්වල වටිනාකම රු.1,342,539 ක් විය.

(ආ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව මුද්‍රණය කිරීම නිසා 2017 ජනවාරි 30 දිනට ආයතනයේ ගබඩාවේ ඉතිරිව තිබුණු විවිධ ප්‍රකාශනවල වටිනාකම රු.438,638 ක් විය.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් ඉලක්ක දිනයන්හි ඉදිරිපත් කළ යුතු මූලික වාර්තා, කාර්තු වාර්තා හා අදාළ වර්ෂයේ සාරාංශ වාර්තාව විගණන කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඊට ඇතුළත් කර නොතිබුණු අතර, එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දක්වා නොතිබුණි. තවද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 ක් නොඉක්මවන කාලය තුළ ක්‍රමවත්ව යාවත්කාලීන කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව දීර්ඝ කාලීන පරමාර්ථ ඉටුකර ගැනීමට සහ වර්ෂය ආරම්භයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් වශයෙන් දැරීමට අපේක්ෂිත වියදමින් සියයට 52.14ක් පමණක් වියදම් කර තිබීම හේතුවෙන් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ---------------------------- | | ------------ |
| (අ) | මූල්‍ය කළමනාකරණය | - | අදාළ අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි ප්‍රදාන හා අරමුදල් උපයෝජනය නොකිරීම. |
| (ආ) | පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම | - | මුදල් රෙගුලාසි සහ අදාළ චක්‍රලේඛ ප්‍රකාරව පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම. |